# රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
## பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
## Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.
சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை.
**Independence Square, Colombo 07, Sri Lanka.**


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | CS/SLAS/Vacancies - Reply (Vol – I) | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2023.02.27 |

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන නිවේදනයයි.

**<u>හානිපූරණය සඳහා වන කාර්යාලයේ අධ්‍යක්ෂ තනතුර සඳහා</u>**

**<u>ද්විතීයන පදනම මත අනුයුක්ත කිරීම</u>**

පීඩාවට පත් වූ පුද්ගලයින් වෙත ලබා දිය යුතු හානිපූරණයන් සඳහා වන ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීමෙහිලා කටයුතු සිදු කරනු ලබන හානිපූරණය සඳහා වන කාර්යාලයේ අධ්‍යක්ෂ තනතුර සඳහා ද්විතීයන පදනම මත ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු අනුයුක්ත කිරීමට කටයුතු කරන ලෙස හානිපූරණය සඳහා වන කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක OFR/ADM/Dir./2019-2022 හා 2022.12.23 දිනැති ලිපිය මඟින් දන්වා ඇත.

02. එම තනතුරට අදාළව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් තොරතුරු පහත පරිදි වේ.

i. සේවා ගණය - ජ්‍යෙෂ්ඨ කළමනාකාර

ii. තනතුර - අධ්‍යක්ෂ

iii. වැටුප් කේත අංකය - HM1-1

iv. මාසික වැටුප් පරිමාණය - 81670-2270x15-115720

v. අධ්‍යාපන සුදුසුකම් - විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළි ගන්නා ලද විශ්ව විද්‍යාලයකින් රාජ්‍ය පරිපාලන / කළමනාකරණ / රාජ්‍ය ප්‍රතිපත්ති / ආර්ථික හා සමාජ සංවර්ධන යන විශය ක්ෂේත්‍රයන්ට අදාළ ප්‍රථම උපාධිය හා විද්‍යාපති / ශාස්ත්‍රපති හෝ ඊට ඉහළ පශ්චාත් උපාධියක් ලබා තිබීම

සහ

vi. පළපුරුද්ද - උපාධි ලබා ගැනීමෙන් පසු රජයේ හෝ රාජ්‍ය ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 15ක පළපුරුද්ද

03. ඒ අනුව හානිපූරණය සඳහා වන කාර්යාලයේ අධ්‍යක්ෂ තනතුර සඳහා අනුයුක්ත වීමට මනාපය පළ කරනු ලබන ඉහත සඳහන් සුදුසුකම් සහිත ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් වේ නම්, ඒ සම්බන්ධයෙන් වන ලිඛිත ඉල්ලීමක්, තමාගේ ජීව දත්ත සටහනක් සමඟ ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත පාලන අමාත්‍යාංශය වෙත 2023.03.17 දිනට පෙර ලැබෙන සේ ඉදිරිපත් කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

04. එම තනතුරට අදාල වන කාර්යභාරය සහ වැඩිමනත් තොරතුරු අවශ්‍ය වේ නම්, “හානිපූරණය සඳහා වන කාර්යාලයේ සහකාර අධ්‍යක්ෂ (පාලන) - 011 2883949/011 2883204” වෙතින් විමසන ලෙස ද වැඩිදුරටත් කාරුණිකව දන්වමි.



කේ.ඩී.එන්. රංජිත් අසෝක
අතිරේක ලේකම් (රාජ්‍ය පරිපාලන)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ
ලේකම් වෙනුවට

දුරකථන : 0112-698605 /
ෆැක්ස් : 0112 – 683651
විද්‍යුත් ලිපිනය: pubad.dslas@gmail.com

පිටපත :

1. අධ්‍යක්ෂ ජනරාල්, හානිපූරණය සඳහා වන කාර්යාලය